# ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRCSL)

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRCLS) යනු දිවයිනේ රාජ්‍ය අංශයේ විද්‍යාඥයින් හට, මූල්‍ය සහාය සපයන, රජයේ අරමුදල් සම්පාදනයෙහි නියැලි නියෝජිතායතනයකි.

ජාතික පර්යේෂණ සභාවෙහි (NRC) හි, පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් දැන් කැඳවනු ලැබේ.

## ප්‍රධාන විධායක නිලධාරී : HM 2-1 තනතුර

**රැකියා විස්තරය :** ජාතික පර්යේෂණ සභාවේ සියලුම ක්‍රියාකාරකම් සහ පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ ගිණුම් හා වගකීම් භාරය දැරිය යුතුය. සභාවේ පොදු විධානය මග පෙන්වීම සහ පාලනය යටතේ සභාවේ කාර්ය කර්තව්‍යයන් සහ රාජකාරී ඉටුකිරීම බලාත්මක කිරීම සහ බලතල ක්‍රියාවේ යෙදවීම සහ ඒවා සභාව විසින් බලය පවරන ලද පරිදි සිදුකිරීම, ජාතික පර්යේෂණ සභාවේ කාර්ය මණ්ඩලයට නායකත්වය සැපයීම හා දිරිමත් කිරීම, තිලයේ විශිෂ්ටත්වයේ අත්කරගත්තා ජයග්‍රහනයන් හා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීම සහ සභාවේ අරමුණු හා ක්‍රියාන්විතයන් හඹායාම ධුරයේ වගකීම් භාරයන්ට අන්තර්ගතය.

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගන්නා වූ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව/ කෘෂිකර්ම විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික සාමාජිකත්වය.

   **සහ**

   කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 20 ක පළපුරුද්ද ඉන් වසර 05ක් (පහක්) ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය. තවද ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සනාථ කළ පෙර සේවා වාර්තාවක්ද සහිත විය යුතුය.

   **හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව/ කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක දර්ශනශූරී / ආචාර්ය (PhD) උපාධියක්.

   **සහ**

   සනාථ කළ සේවා වාර්තාවක් සහිතව ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර පහක (05) ක පළපුරුද්ද සහ රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු ලත්, කළමනාකරණ පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 2-1 [රුපියල් 91,645–2, 700X12–124,045]

**තනතුරට අදාළ වෙනත් කොන්දේසි**

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හා තනතුරට පැවරෙන සියලු රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකි වන සේ කායිකව හා මානසිකව යෝග්‍යතාවයෙන් හා ශක්තිමත් සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්කරුවන් අනර්ඝ හා විශිෂ්ට චරිත ස්වභායෙන් යුක්ත විය යුතුය.
4. බඳවා ගැනීම්, පත්වීම් බලාධිකාරිය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකරනු ලැබේ.
5. මෙම පත්වීම ස්ථිර පදනම මත වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) හිමිකාරිත්වය ලබනු ඇත. 2016 අංක 11 දරන ජාතික පර්යේෂණ සභා පනතේ විධිවිධාන පරිදි මෙම පත්වීම පත්වීම්ලාභියාගේ පත්වීම ලද දිනයේ සිට ගණනය කෙරෙන වසර පහක (05) කාල සීමාවක් සඳහා වනු ඇත. ප්‍රධාන විධායක නිලධාරියා නැවතත් පත්කරනු ලබන්නේ නම් හැර ප්‍රධාන විධායක නිලධාරීයා වශයෙන් ඔහු/ ඇය පත්වීම් ලද දිනයට පෙරාතුව, එකී පනත මගින් පාලන වන ආයතනයක, කාර්ය මණ්ඩල සාමාජිකයෙකු/ සාමාජිකාවක ඔහු/ ඇය වූවේ වී නම් ඔහු/ ඇය හැටවන වසර සම්පූර්ණ කර නොමැති විටදී ආයතනයේ සිය නිත්‍ය පදවියට නැවත පත් කරනු ලබනු ඇත.
6. ජාතික පර්යේෂණ සභාවේ නියමිත තනතුරට අදාළ වෙනත් ආන්තික/ අමතර පහසුකම් / ප්‍රතිලාභ (රථ වාහනයක් හෝ වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ දුරකථන පහසුකම් දීමනාව)
7. අයදුම්කරුවන් විසින් සිය අත්සන් යෙදූ අයදුම්පත් සිය උප්පැන්න සහතිකය සහ වෙනත් අදාළ සහතිකවල පිටපත්ද ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සහිතව අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන්කර **2021 අප්‍රේල් මස 20 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් කුරියර් දූත සේවය මගින් කොළඹ 07, විද්‍යා මාවතේ, අංක 120/7 හි ජාතික පර්යේෂණ සභාවේ සභාපති වෙත, යොමු කිරීම කළ යුතු වන්නේය.
8. අයදුම්කරුගේ ජීවදත්ත තොරතුරු ප්‍රකාශහි පරිලෝකනගත කළ පිටපතක් (Scan Copy) විද්‍යුත් තැපැලෙන් (Email) මගින් admin@nrc.gov.lk වෙත Covid අදාළ තැපැල් / කුරියර් ප්‍රමාදයන් වලකා ගැනීම සඳහා කලට වේලාවට ඉදිරිපත් කිරීම තහවුරු කිරීම අරහයා එවිය යුතුය. CV හි සියලු පිටුවල අපේක්ෂකයා විසින් සිය අත්සන යොද තිබිය යුතුය.
9. රජයේ දෙපාර්තමේන්තුවල/ සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
10. ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන සියලුම අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම ජාතික පර්යේෂණ සභාවේ (NRC) හි වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත. www.nrc.gov.lk

**සභාපති, ජාතික පර්යේෂණ සභාව,**
**අංක 120/7, විද්‍යා මාවත, කොළඹ 07.**
**දුරකථන : 011-2675176**
**ෆැක්ස් : 011-2675136**
**ඊමේල් : admin@nrc.gov.lk**